**මන්මුනේ ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මන්මුනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වීම. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සඳහා කටයුතු කෙරේ. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි කොට්ඨාශ 11 කින් එක් කොට්ඨාශයක පිහිටි දේපල මත වරිපනම් බදු හිඟය රු.86,360 ක් ලෙස ගණනය කර තිබුණි. එසේ | හිඟ වරිපනම් බදු ලේඛනය පදනම් කරගනිමින් ගණනය කිරීම් සිදුකර ගිණුම්ගත කළ යුතු වීම. | සඳහන් කර තිබූ රු.86,360 ක හිඟ වරිපනම් බදු හිස් ඉඩමක් සඳහා වේ. මෙම හිස් ඉඩම අයිති ඉඩම් හිමියන් හඳුනාගෙන බදු අයකිරීම දුෂ්කර බැවින් මෙම හිඟය ලේඛනවල පෙන්නුම් කෙරේ. |

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | වුවත්, ප්‍රාදේශීය සභාව විසින් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ හිඟ වරිපනම් බදු විධිමත්ව ගණනය කර ගිණුම්ගත නොකිරීම නිසා හිඟ ශේෂය ශූන්‍ය අගයක් වී තිබුණි. | | |
| (ආ) | මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු ආදායමකි. එසේ වුවත්, 2018 කාලපරිච්ඡේදයේ නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් වැඩිපුර අයකළ මුද්දර ගාස්තු රු.121,000 ක් විගණන දිනය වන 2019 මාර්තු 31 දින වන විටත් ලබා දී නොතිබුණු බැවින් මෙම වටිනාකම ගිණුම්වලට ගෙන නොතිබුණි. | ඉදිරි කාලවලදී නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන ජංගම සේවාවන් සහ සෘජු අයකිරීම් පිළිබඳව අවධානය යොමු කළ යුතු වීම. | නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් වැඩියෙන් අයකරනු ලැබූ රු.121,000 ක් ආපසු ලබාගැනීමට අවශ්‍ය සියළුම ක්‍රියාමාර්ග ගනු ලැබේ. අදාළ ලියකියවිලි නොලැබීම හේතුවෙන් නියමිත කාලපරිච්ඡේදය තුළ අවධානය යොමු නොකෙරුණි. |

**1.3.3 අසම්භාව්‍ය බැරකම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින දක්වා 2016 සහ 2017 වර්ෂවලදී සභාව විසින් බාහිර පාර්ශවයන් 02 කට එරෙහිව ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ගයක් සම්බන්ධයෙන් වන තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වීම. | බාහිර පාර්ශවයන් අපගේ සභාවට එරෙහිව ආරම්භ කළ නඩු දෙක සඳහා නීතිඥ ගාස්තු අප වෙත කලින්ම දැනුම් නොදීම හේතුවෙන් අසම්භාව්‍ය බැරකම් ගිණුම්වල දක්වා නොතිබුණි. |

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන හිඟ හිටි විදුලි ණයගැතියෝ රු.781,370 ක් අඛණ්ඩව වර්ෂ 10 කට අධික කාලයක සිට ගිණුම්වල ඉදිරිපත් කර තිබුණත් එහි හිඟ හිටි වටිනාකම් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට හෝ සනාථ කළ ලියවිලි පදනම් කරගනිමින් පොත්වලින් කපා හැරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | ලැබිය යුතු හා ගෙවිය යුතු වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව හිඟ හිටි ලෙස ඉදිරිපත් කර තිබුණත් එම වටිනාකම කපා හැරීමට කටයුතු කරමින් පවතී. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල ණය බැරකමක් ලෙස ඉදිරිපත් කර තිබූ ණයහිමියන් රු.1,998,535 ක් සහ විදුලිය බෙදාහැරීම වෙනුවෙන් රු.1,958,630 ක් වර්ෂ 05 කට අධික කාලයක සිට හඳුනාගෙන ඒවා නිරවුල් කිරීමට හෝ ඒවා පොත්වලින් කපාහැරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමට හෝ ඒවා කපාහැරීමට කටයුතු කළ යුතු වීම. | ලැබිය යුතු හා ගෙවිය යුතු වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව හිඟ හිටි ලෙස ඉදිරිපත් කර තිබුණත් එම වටිනාකම කපා හැරිමට කටයුතු කරමින් පවතී. |

**1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

(අ) තොරතුරු ඉදිරිපත් නොකිරිම

රු.195,232,508 ක් වටිනා ගිණුම් විෂයයන් 06 ක් සඳහා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. විස්තර පහත දැක්වේ.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- | --- |
| | | රු. | | | |
| (i) | ඉඩම් හා ගොඩනැගිලි | 47,632,607 | ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය | මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති ගිණුම් ශේෂ සනාථ කිරීමේ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වීම. | ඔබ විසින් සඳහන් කළ විගණන සාක්ෂි කිහිපයක් ඉදිරිපත් කිරීමේදී ඇතැම් සාක්ෂි අසම්පූර්ණව පැවති අතර එය සම්පූර්ණ කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ii) | යන්ත්‍රෝපකරණ | 5,128,607 | ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකාරීත්වය තහවුරු කෙරෙන ලිපි ලේඛන | | |
| (iii) | මෝටර් රථ හා වාහන | 22,922,155 | ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකාරීත්වය තහවුරු කෙරෙන ලිපි ලේඛන | | |
| (iv) | විදුලි තොග අයිතමයන් | 10,183 | තොග ලේඛන | | |
| (v) | විදුලිය බෙදාහැරීම වෙනුවෙන් වූ ණය | 1,958,630 | ගෙවිය යුතු ලේඛන | | |
| (vi) | ජල නල සම්බන්ධතා | 999,041 | තක්සේරු වාර්තා, කාර්යය අවසන් කිරීමේ වාර්තා සහ ගෙවීම් වවුචර් | | |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) හා (2) වගන්ති හා පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් කර්මාන්ත අමාත්‍යාංශයේ 1988 ජනවාරි 13 දිනැති අංක 488/16 දරන රජයේ ගැසට් නිවේදනයේ 31(1) උප වගන්තිය | ප්‍රාදේශීය සභා ක්‍රියාකාරකම් පහසු කිරීමේ අරමුණින් අංග සම්පූර්ණ තීරණ හා උපදෙස් ලබාගැනීම සඳහා සභාවේ මූල්‍ය, ප්‍රතිපත්ති සැලසුම් කිරීම්, නිවාස ඉදිකිරීම්, සමාජ සංවර්ධන, තාක්ෂණික සේවා, පාරිසරික සහ පොදු පහසුකම් වැනි කාරණා සඳහා වෙන වෙනම කමිටු ස්ථාපිත කර උපදෙස් ලබාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම කමිටු ස්ථාපිත කිරිමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නියමිත රිතීන්වලට අනුව නිත්‍ය කමිටු ස්ථාපිත කර ඒවා සුදුසු ආකාරයෙන් ක්‍රියාත්මක කර උපදෙස් ලබාගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | සභා සාමාජිකයන් අතර ඇති වූ නොඑකඟතාවයන් හේතුවෙන් නිත්‍ය කමිටු ස්ථාපිත කිරීමේ කාල ප්‍රමාදයන් සිදු වී තිබුණි. මෙම කමිටු 2019 වර්ෂයේ ස්ථාපිත කර ක්‍රියාත්මකව පවතී. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය | අදාළ ඇතැම් හිමිකම් ගාස්තු අයකිරීම සඳහා සභාවට ඇති අයිතිවාසිකම පදනම් කරගනිමින් නේවාසිකාගාර ආපන ශාලාවක් හෝ ලැඟුම්හල් මත එහි අයිතිකරුට ලැබෙන මුදල අනුව සියයට 1 කට වැඩි ප්‍රමාණයක් අයකිරිම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. එසේ වුවත්, සභාව විසින් අයකළ මෙම බදු ලැබූ මුදල් පදනම්ව ගණනය කර අයකිරීම සිදුකර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියට අනුව ලැබූ මුදලින් එක් ප්‍රතිශතයක් අයකිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වීම. | අපගේ ප්‍රදේශයේ පවතින නේවාසිකාගාර ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාර ලැබූ මුදලින් එක් ප්‍රතිශතයක් අප විසින් අයකළ විට ඔවුන්ගේ සත්‍ය ලැබූ මුදල් හඳුනාගැනීම අපහසු වී තිබුණත්, වර්තමානයේ ඔබගේ උපදෙස් අනුව ආදායම් බදු දෙපාර්තමේන්තුව මඟින් තොරතුරු ලබා ඒ අනුව අයකිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ I පරිශිෂ්ඨයේ 193 වැනි රීතිය | සමාලෝචිත වර්ෂය සඳහා සත්‍ය ආදායම් සහ වියදම් පිලිබඳ තොරතුරු අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පනතේ විධිවිධානවලට අනුව ක්‍රියාමාර්ග ගත යුතු වීම. | මෙම සැසඳීම සමීක්ෂණ ස්වරූපයේ විය. සාමාන්‍යයෙන් අවසන් ගිණුම්වල නිරූපනය නොකෙරේ. 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලබන අතර නව ගිණුම් ක්‍රමයට අනුව පිළියෙල කර ගිණුම්වලට එකතු කරනු ලැබේ. |
| (ඈ) | 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛයේ 09/2009 හි IV වගන්තිය | කාලය පදනම් කරගනිමින් අමතර වේලාව සහ නිවාඩු දින වැටුප් වැනි නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන වැටුප් සම්බන්ධයෙන් වේලාව පදනම් කරගැනීමේදී එම වේලාව ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් තහවුරු කළ යුතු බව සඳහන්ව ඇත. එසේ වුවත්, නිලධාරියෙකු වෙත පැමිණීම සහ පිටවීම ඇඟිලි සලකුණු මඟින් නිවාඩු දින සේවය කිරීම සනිටුහන් නොකළත් සභාව විසින් රු.39,343 ක් නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | චක්‍රලේඛයට පටහැනිව ගෙවීම් සිදුකළ බැවින් එය ආපසු අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | අප සභාවේ පවතින ඇඟිලි සලකුණු යන්ත්‍රය 2018 වර්ෂයේ සිට මේ දක්වා අක්‍රීයව පවතී. වර්තමානයේ නව යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවා ඇත. ඉන් පසුව නිසි අයුරින් කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.15,041,101 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.10,346,935 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,694,166 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලොචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,500,000 | 1,957,592 | 1,957,592 | - | 1,500,000 | 1,869,820 | 1,870,507 | - |
| කුලී | 5,041,700 | 5,236,400 | 4,798,100 | 438,300 | 4,899,600 | 5,502,355 | 5,337,655 | 164,700 |
| බලපත්‍ර ගාස්තු | 1,125,000 | 1,651,150 | 1,654,900 | - | 1,090,000 | 1,409,200 | 1,409,200 | - |
| අනෙකුත් ආදායම් | 1,500,000 | 1,957,592 | 1,957,592 | - | 1,500,000 | 1,869,820 | 1,870,507 | - |

### 2.2.2 ආදායම් රැස්කිරිමේ කාර්යසාධනය

#### 2.2.2.1 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 140(1) උප වගන්තිය අනුව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ 11 ක පිහිටි ග්‍රාම සේවක වසම් 27 ක වරිපනම් තාවකාලික වරිරපනම් ස්ථිර කිරීමටත් ඒ මඟින් සභාවේ ආදායම් වැඩි කර ගත හැකි බව සභාවේ ආදායම් පරීක්ෂකවරුන් 2018 සැප්තැම්බර් 21 දින යෝජනා කර තිබූ නමුත්, විගණන දිනය වන 2019 මැයි 08 දින වන විටත් ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගනු ලැබූ තීරණවලට අනුව කටයුතු සිදුකළ යුතු වීම. | සභාව විසින් තීරණය කර මහජන අදහස් ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පැවැති ග්‍රාම සේවා වසම් 27 කින් ග්‍රාම සේවා වසම් 11 ක 1987 අංක අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 140(1) උපවගන්තිය අනුව වට්නාකම් තක්සේරු කර වරිපනම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | තීරණවලට අනුකූලව වට්නාකම් තක්සේරු කිරීමට කටයුතු කළ යුතු වීම. | ග්‍රාම සේවා වසම් 10 ක දේපල තක්සේරු කිරිමේදී අයකරනු ලබන වරිපනම් බදු සඳහා සභාවේ අනුමැතිය ලබා නොගැනීම නිසා එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අපට නීතිමය ගැටළු මතු වූ බැවින් ඉතිරි ඒවා සඳහා වට්නාකම් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. |

**2.2.3 අනෙකුත් ආදායම්**

----------------------

**JCB යන්ත්‍රය භාවිතය**

------------------------

තම ප්‍රාදේශීය සභාව විසින් පළාත් ණය හා සංවර්ධන අරමුදල (LLDF) යටතේ ණය සහ සභා අරමුදල් මඟින් JCB යන්ත්‍රයක් මිලදී ගෙන සභාවේ කාර්යයන් හා තනි පුද්ගලයන්ට ලබාදීමෙන් ආදායම් ඉපැයීම සඳහාත් භාවිතා කරමින් පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් මෙම යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොමැතිවීමෙන් සභාව විසින් පළාත් ණය හා සංවර්ධන අරමුදල යටතේ ණය ලබා JCB යන්ත්‍රය මිලදී ගැනීමට තීරණය කර, සභා අරමුදලෙන් රු.2,300,000 ක් සහ ණය අරමුදලෙන් රු.11,500,000 කට මිලදී ගෙන තිබුණි. සභාවේ ආදායම් වැඩිකර ගැනීම සඳහා මිලදී ගෙන තිබූ නමුත් සභාව විසින් මෙම යන්ත්‍රය උපයෝජනය මඟින් පාඩු පමණක් ලබා තිබුණි. | සභා කාර්යයන් සඳහා පැයක වට්නාකම ගණනය කර ගිණුම්වල ඉදිරිපත් කළ යුතු වීම. | වියදම් සමාලෝචනයේදී පාඩු ලෙස නිරීක්ෂණය වුවත්, එම සමාලෝචනයේදී සභාවේ කාර්යයන් සඳහා වැය කර තිබූ පැය සඳහා ආදයම ඇතුළත් කර නොතිබුණි. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට ආදායම් ඉපැයීමේ අරමුණෙන් මිලදී ගෙන තිබූ මෙම යන්ත්‍රය මඟින් භාවිත තොරතුරු රහිතව සභාව තම කාර්යයන් සඳහා යන්ත්‍ර පැය 271 ක් භාවිතා කර කිබූ බැවින් | JCB යන්ත්‍රය අභ්‍යන්තර ඉදිකිරීමේ කාර්යයන්වල යොදවා තිබූ බැවින් එහි විස්තර හෙළිදරව් කළ යුතු වීම. | Vision, Mission අභ්‍යන්තර ඉදිකිරීම් මහජනතාවට සිදුකළ යුතුව තිබුණි. ඒ අනුව, JCB යන්ත්‍රය අභ්‍යන්තර ඉදිකිරීම් කාර්යයන්වල යොදවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | සභාවට මෙම සේවාව මඟින් රු.813,000 ක් අහිමි වී තිබුණි. | | |
| (ඇ) | ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මෙම යන්ත්‍රය සඳහා නඩත්තු වියදම් ලෙස ඉන්ධන, යන්ත්‍ර අලුත්වැඩියා, රියදුරු වැටුප් සහ යන්ත්‍රයේ ක්ෂය ආපසු ගෙවීම් ආදිය ඇතුළත්ව ආසන්න වශයෙන් රු.1,751,641 ක් වැයකර තිබුණි. සභාව මෙම යන්ත්‍රය භාවිතා කිරීම නිසා රු.557,835 ක් පමණක් ආදායම් ලෙස උපයාගෙන තිබුණි. මෙම ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේදී වාර්ෂිකව සභාව විසින් රු.1,200,000 ක් ආසන්න වශයෙන් අහිමි කිරීමට සිදුවිය හැකිය. | සභාවේ කාර්යයන් සඳහා පැයකට අදාළ වටිනාකම් ගණනය කර ගිණුම්වල ඉදිරිපත් කළ යුතු වීම. | සභාවේ කාර්යයන් සඳහා මෙම යන්ත්‍රය භාවිතා කර තිබූ බැවින් මෙම පැය ගණන සඳහා ආදායම් ඇතුළත් නොකිරීම නිසා පාඩු ලෙස පෙන්නුම් කෙරේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ මෙම යන්ත්‍රය පුද්ගලික කාර්යයන්, සභාවේ කාර්යයන් සහ උසස් නිලධාරීන් විසින් පනවනු ලබන කාර්යයන් සඳහා ද යොදවා තිබුණි. එසේ වුවත්, ඇතැම් වේලාවන්වලදී පමණක් සභාපතිවරයාගේ සහ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන තිබුණි. අනෙකුත් වේලාවන්වලදී කිසිදු අනුමැතියකින් තොරව මෙම යන්ත්‍රය කාර්යයන් සඳහා යොදවා ගනී. මෙම යන්ත්‍රයේ භාවිතය පිළිබඳ විධිමත් සැලැස්මක්, අභ්‍යන්තර පාලනය සහ වාර්තා සකස් කිරීම නියමාකාරයෙන් ක්‍රියාත්මක කර නොතිබුණි. | අභ්‍යන්තර පාලන ක්‍රමයක් අනුගමනය කළ යුතු වීම. | ඒ සඳහා විසඳුම් ඵලදායී අභ්‍යන්තර පාලනයක් මඟින් නිරවුල් කිරීමට කටයුතු යොදා ඇත. |

### 2.2.4 මුද්දර ගාස්තු සහ උසාවි දඩ ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දින වන විට උසාවි දඩ ගාස්තු රු.904,516 ක් සහ මුද්දර ගාස්තු රු.14,135,196 ක් ලැබිය යුතුව තිබුණි.

#### (අ) උසාවි දඩ ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු.904,516 ක උසාවි දඩ ගාස්තු 2017 ජුනි සිට දෙසැම්බර් මාසය දක්වා හිඟහිටව පැවති මුදල් විය. එසේ වුවත්, 2018 වර්ෂය අවසානය දක්වා ලැබිය යුතු සියළුම උසාවි දඩ මුදල් ලබාගැනීම සඳහා විගණන දිනය වන 2019 මැයි 08 දින වන විටත් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ක්‍රියාමාර්ග ගත යුතු වීම. | පළාත් පාලන කොමසාරිස්වරයා මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |

#### (ආ) මුද්දර ගාස්තු

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2017 සහ 2018 කාල පරිච්ඡේදයේ නිශ්චල දේපල පැවරීම් මත මුද්දර ගාස්තු මඩකලපුව දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් රැස්කර නැගෙනහිර පළාත් මහා භාණ්ඩාගාර ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. මෙම මුද්දර ගාස්තු පළාත් පාලන ආයතන විසින් ලබාගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | නැගෙනහිර පළාත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවෙන්, නැගෙනහිර පළාත් සභාව 2008 වර්ෂයේ අංක 1 දරන බදු හා ගාස්තු පැනවීමටත් රැස්කිරීමටත් මූල්‍ය නීති පනතේ 37 වැනි වගන්තියට අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින නිශ්චල දේපල පැවරීම නැගෙනහිර පළාත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවෙන් 2016, 2017 සහ 2018 දෙසැම්බර් මස දක්වා කාලපරිච්ඡේදයේ සෘජුව හා ජංගම සේවාවන් මඟින් අයකළ | ඉදිරි කාලපරිච්ඡේදවලදී නැගෙනහිර පළාත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ජංගම සේවාවන් සහ සෘජු අයකිරීම් පිළිබඳව අවධානය යොමු කළ යුතු වීම. | මේ පිළිබඳව අදාළ බලධාරීන් සමඟ විමසීමේදී අපහට කිසිඳු ආකාරයක බදු ආපසු ගෙවීම් ලබා නොදෙන බව සඳහන් කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| | අමතර මුද්දර ගාස්තු සම්බන්ධයෙන් දේපල හිමියන් විසින් නැගෙනහිර පළාත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ මුද්දර ගාස්තු ගණනය කර අයකිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ii) | මුද්දර ගාස්තු සභාවට ලැබිය යුතු ආදායමකි. එසේ වුවත්, 2018 වර්ෂ කාලපරිච්ඡේදයේ නැගෙනහිර පළාත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව විසින් වැඩිපුර අයකරනු ලැබූ මුද්දර ගාස්තු රු.121,000 ක් විගණන දිනය වන 2019 මාර්තු 31 දින වන විටත් ප්‍රාදේශීය සභාවට ලැබී නොතිබුණි. | ඉදිරි කාලපරිච්ඡේදවලදී නැගෙනහිර පළාත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ජංගම සේවාවන් සහ සෘජු අයකිරීම් පිළිබඳව අවධානය යොමු කළ යුතු වීම. | මේ පිළිබඳව අදාළ බලධාරින් සමඟ විමසීමේදී අපහට කිසිඳු ආකාරයක බදු ආපසු ගෙවීම් ලබා නොදෙන බව සඳහන් කරන ලදී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුඛසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

-------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ විධිමත් කිරීම් සඳහා ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. එසේ වුවත්, ප්‍රාදේශීය සභාව විසින් අතුරු ව්‍යවස්ථා 08 ක් 2012 වර්ෂයේදීත්, අතුරු ව්‍යවස්ථා 06 | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | භාෂා තුනෙන්ම අතුරු ව්‍යවස්ථා පිළියෙල කර අදාල අනුමැතීන් සඳහා පළාත් පාලන අමාත්‍යාංශයට යවා තිබූ නමුත්, (දැනට අතුරු ව්‍යවස්ථා 05 ක් සඳහා) දැනට පවතින සභාවේ තීරණය ඉල්ලා තිබුණි. |

ක් 2013 වර්ෂයේදීත් සහ තවත් අතුරු ව්‍යවස්ථා 04 ක් 2017 වර්ෂයේදී ත් සකස් කර සභාව විසින් අතුරු ව්‍යවස්ථා පිළිබඳ යෝජනා නැගෙනහිර පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යවා තිබුණි. එසේ වුවත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා අනුමැතිය ලබා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ආදායම් සහ විධිමත් කිරීම් සඳහා කාරණා 18 ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා සකස් කොට ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. එසේ වුවත්, අනුමැතිය ලබා ගැනීම සඳහා සකස් කළ අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව, සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ කාර්යයන් 18 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | ඔබගේ උපදෙස් අනුව කාර්යයන් 18 ක් සම්බන්ධයෙන් ඉදිරියේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් ක්‍රියාත්මක කරනු ලැබේ. |

**(ඇ) මූල්‍ය ප්‍රතිපාදන සලසා නොතිබීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් 2016-2020 කාලපරිච්ඡේදය සඳහා පළාත් පාලන ආයතනය සඳහා වර්ෂ 04 ක සංවර්ධන සැලැස්මක් (LAPDP) පිළියෙල කර තිබුණි. සභා අරමුදල් සහ නැගෙනහිර පළාත් සඳහා වෙන්කළ සංවර්ධන වැඩසටහන් ආධාර මුදල් ආදිය පදනම් | ඉදිරියේදී මූල්‍ය සම්පත් සැලකිල්ලට ගනිමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. | වර්ෂ 04 ක සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් සංවර්ධන සැලසුම් කිහිපයක් ක්‍රියාත්මක කර තිබුණි. අනාගතයේදී මූල්‍ය සම්පත් සැලකිල්ලට ගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |

කරගනිමින් පිළියෙල කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව, සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබුණු ක්‍රියාකාරකම් 310 කින් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරකම් 34 ක් පමණක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි.

**(ඇ) අත්හැර දැමූ කාර්යභාරයන්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සභාව විසින් මස් කඩ 02 ක් සහ සිල්ලර කඩ 02 ක් ඉදිකිරීම සඳහා මුළු ඇස්තමේන්තුව රු.709,686 කට ඇස්තමේන්තු සකස් කර ගිවිසුම් ගත වී තිබුණි. එසේ වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.710,000 ක් ගෙවිය යුතුව පැවති බව දක්වා තිබුණි. එසේ වුවත්, සභාව විසින් ඒවා ඉදිකිරීම් සම්බන්ධ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කඩිනම් ක්‍රියාමාර්ග ගෙන ඉඩම් හඳුනාගෙන කඩ කාමර ඉදිකිරීම සඳහා පියවර ගත යුතු වීම. | මෙම කඩ කාමර ඉදිකිරීම සඳහා ගිවිසුම් ගත වී තිබුණත් අදාළ ඉඩම් ලබාගැනීමේදී සිදු වූ දුෂ්කරතා හේතුවෙන් කඩ කාමර ඉදිකළ නොහැකි විය. තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා උත්සාහයන් ගනු ලැබේ. |

**(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සභාව විසින් ක්‍රියාත්මක කළ දීර්ඝකාලීන හා කෙටිකාලීන ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.4,752,654 ක් වැය කර තිබුණි. එසේ වුවත්, සභාවේ ආදායම් ලෙස රු.1,152,040 ක් ලැබී තිබුණි. මෙම ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සභාව විසින් දිගුකාලීන සහ කෙටිකාලීන ව්‍යාපෘති සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. එමඟින් නව සැලසුම් යෝජනා කර අවශ්‍ය රියදුරන්, අපද්‍රව්‍ය රැස්කිරීම සඳහා වාහන, සෞඛ්‍ය කම්කරුවන් වැඩිකිරීම සහ ගම්මානවල පරිසරය | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සභාව විසින් කෙටිකාලීන හා දිගුකාලීන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා උත්සාහ දැරිය යුතු වීම. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව සභාවේ කෙටිකාලීන හා දිගුකාලීන සැලසුම් ඇති නමුත් ඒවා ක්‍රියාත්මක නොකර පැවතුණි. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් තාවකාලික මානව සම්පත් අනුයුක්ත කර තිබූ අතර වාහන සංඛ්‍යාවද වැඩි කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ආරක්ෂා කිරීමේ කමිටු ස්ථාපිත කර ඒ මඟින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සංවර්ධනය කිරීමේ සැලසුම් මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| (ii) | සභා බල ප්‍රදේශයට අයත් ප්‍රදේශවල පිහිටි නිවාස, ආයතන, කඩ කාමර සහ පොදු ස්ථානවලින් කසල වෙන්කර එකතු කිරීමේ කාර්යය ජනතාවගේ මැලිකම හා නොසැලකිල්ල හේතුවෙන් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක නොවන බැවින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙන් කාබනික පොහොර නිෂ්පාදනය සහ ප්‍රතිචක්‍රීයකරණය විකිණීම වැනි සැලසුම් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | නව සැලසුම් හඳුන්වා දී ඒවා ක්‍රියාත්මක කිරීම. | අමතර කසල සඳහා බදු අයකිරීමේ සම්මතයක් (පුරුද්දක්) ඇත. එසේම, සාමූහික ගොවිපළක් ස්ථාපිත කර සැලසුම් ක්‍රියාත්මක කර තිබුණි. |
| (iii) | සභා බල ප්‍රදේශයේ පිහිටි නිවාස, ආයතන, කඩ කාමර සහ පොදු ස්ථානවලින් කුණු කසල එක්රැස් කර කාබනික පොහොර නිෂ්පාදනය කර නිෂ්පාදනයන් වර්ධනය කිරීම සඳහා දිරන අපද්‍රව්‍ය ඇඹරිය හැකි යන්ත්‍ර, කෙසෙල් ගස් කැපිය හැකි යන්ත්‍ර හා අපද්‍රව්‍ය වෙන්කිරීමේ යන්ත්‍ර ආදිය මිලදී ගෙන ඒවා භාවිතා කිරීම මඟින් ආදායම් වැඩිකර ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කර නොතිබුණි. | අනාගතයේදී නව සැලසුම් සකස් කිරීම සඳහා කටයුතු කළ යුතු වීම. | අනාගතයේදී නව සැලසුම් සකස් කිරීම සඳහා කටයුතු කර ඇත. |

**(ඊ) තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන | 2015 තිරසාර සංවර්ධන සම්මේලනයේ තීරණ අනුව ක්‍රියාකළ යුතු වීම. | තිරසාර සංවර්ධන ඉලක්ක ස්ථාපිත කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත සේවක සංඛ්‍යාව අනුව සංවර්ධන නිලධාරීන් 05 දෙනෙකු රාජකාරී කළ යුතු සභාවේ වගකීම් හා රාජකාරී ඉටු කිරීම සඳහා සංවර්ධන නිලධාරීන් 08 දෙනෙකු සිටිති. ඔවුන්ට ලබාදුන් වගකීම් සහ රාජකාරී ඉටුකිරීමේදී ඵලදායී නොවන අය ලෙස පෙනුණි. මේ නිසා, මහජනතාවට සහ සභාවට කඩිනමින් රාජකාරී ඉදිරියට කරගෙන යාම නොහැකි තත්ත්වයක් දක්නට ලැබුණි. | අදාළ නිලධාරීන් තම රාජකාරී ලබා දී තිබූ රාජකාරී ලේඛනය අනුව ඉටුකරනු ලබන්නේද යන්න අධීක්ෂණය කළ යුතු වීම. | ඔබ විසින් සඳහන් කර ඇති පරිදි ඵලදායී නොවීමට හේතුව අදාළ විෂයයෙන් ප්‍රමාණවත් පුහුණුවක් ලබා නොතිබීම වේ. එසේම, මේ අයගෙන් කිහිප දෙනෙකු නව ස්ථාන මාරු වීම් ලැබ පැමිණි අයවලුන් වීම. |
| (ආ) | සභාවේ වගකීම් හා රාජකාරී සම්බන්ධයෙන් රාජකාරී ඉටුකිරීම සඳහා කළමනාකරණ සහකාරවරුන් 05 දෙනෙකු සිටියද, ඔවුන්ට ලබා දී තිබූ රාජකාරී ලේඛනවලින් 60% ක ප්‍රතිශතයක් පමණක් නිමකර තිබූ බව නිරීක්ෂණය විය. | අදාළ නිලධාරීන් තම රාජකාරී ලබා දී තිබූ රාජකාරී ලේඛනය අනුව ඉටුකරනු ලබන්නේද යන්න අධීක්ෂණය කළ යුතු වීම. | මෙහි රාජකාරී කරන කළමනාකරණ සේවකයින් 05 දෙනාම වෙනත් දෙපාර්තමේන්තුවල රාජකාරී ඉටුකර ස්ථාන මාරු වීම් ලබා අලුතින් පැමිණි අයවේ. ඔවුන්ගේ ඵලදායීත්වය වැඩි කිරීම සඳහා නිසියාකාර පුහුණුවීම් ලබාදෙනු ලැබේ. |
| (ඇ) | සභාවේ සිටින පළාත් පාලන සහකාරවරයා සැලසුම් අංශය භාරව සිටින අතර, සභාවේ සංවර්ධනය පිළිබඳ උපදෙස් නව ආදායම් රැස්කිරීම සම්බන්ධයෙන් සමීක්ෂණයන් පවත්වා, වාර්තා සකස් කිරීම, පරිසරය දූෂණය කරන ආයතන පිළිබඳ වාර්තා ඉදිරිපත් | අදාළ නිලධාරීන් තම රාජකාරී ලබා දී තිබූ රාජකාරී ලේඛනය අනුව ඉටුකරනු ලබන්නේද යන්න අධීක්ෂණය කළ යුතු වීම. | පළාත් පාලන සහකරු ඔහුගේ ඔහුගේ වගකීමහි යම්තාක් දුරට ප්‍රමාදයක් පවතින බව අපටද දැනුණි. |

| | | | |
|---|---|---|---|
| | කිරීම් සහ සංවර්ධන සැලසුම් හඳුනාගෙන ඒවා ඉටුකිරීමට ඇති හැකියාවන් හඳුනාගෙන වාර්තා ඉදිරිපත් කිරීම වැනි වැදගත් රාජකාරී ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය. මේ නිසා සභාවේ සහ ප්‍රදේශයේ සංවර්ධනයෙහි මන්දගාමී බවක් දක්නට ලැබුණි. | | |
| (ඇ) | පළාත් පාලන ආයතනවලට සම්බන්ධ කර ඇති සමාජ සංවර්ධන නිලධාරීන්ගේ වගකීම වන්නේ ප්‍රජා සංවිධානවල කාර්යයන් අධීක්ෂණය කර ප්‍රාදේශීය සභාවලට වාර්තා ඉදිරිපත් කිරීම වී තිබුණි. එසේ වුවත්, මන්මුනෙයි ප්‍රාදේශීය සභා කොට්ඨාශයේ පිහිටි ප්‍රජා සංවිධාන 24 කින්, ප්‍රජා සංවිධාන 24 කින්, ප්‍රජා සංවිධාන 20 ක් පමණක් ක්‍රියාත්මකව පැවති අතර 2016 වර්ෂයෙන් පසුව සියළුම ප්‍රජා සංවිධාන අකර්මන්‍ය වී තිබූ බව නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි ප්‍රජා මධ්‍යස්ථාන ක්‍රියාත්මක වීම සඳහා විධිමත් සැලසුම් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම. | ප්‍රජා නිලධාරීන්ට මේ පිළිබඳ උපදෙස් ලබා දී ඇත. |
| (ඉ) | සභාවේ රාජකාරී කරනු ලබන නිලධාරීන් සහ සේවකයන් සම්බන්ධයෙන් පවත්වා ගෙන යනු ලබන නිවාඩු ලේඛනය විගණනය කිරීමේදී එම සේවකයින්ගේ නිවාඩු ලේඛනයේ කල් ඉකුත් වූ නිවාඩු ලේඛනගත කර නොතිබුණි. මේ නිසා එක් නිලධාරියෙකුගේ කල් ඉකුත් වූ නිවාඩු පිළිබඳ තොරතුරු කඩිනමින් ලබා ගත නොහැකි වී ඇත. | නිවාඩු පිළිබඳ විධිමත් ක්‍රමයක් අනුගමනය කළ යුතු වීම. | පසුගිය කාලයේ නිවාඩු සම්බන්ධයෙන් විධිමත් ක්‍රමයක් අනුගමනය කිරීම සඳහා කටයුතු යොදා ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අවශ්‍ය වැඩ කම්කරුවන් සහ සෞඛ්‍ය කම්කරුවන්ගෙන් කම්කරුවන් 20 දෙනෙකු කළමනාකරණ සේවා | සභාවට අවශ්‍ය වැඩ කම්කරුවන් සහ සෞඛ්‍ය කම්කරුවන් සම්බන්ධයෙන් විධිමත් සේවා සංඛ්‍යා | සභාවට දැනුම් දී තිබූ වැඩ කම්කරුවන් සහ සෞඛ්‍ය කම්කරුවන්ගේ සංඛ්‍යාව 20 දෙනෙකු වේ. ඉන් බහුතරයක් කාන්තාවන්ය. මේ නිසා ඔවුන් කසල |

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබූ නමුත්, සභාව විසින් ආදේශක පදනමින් 24 දෙනෙකු පත්කර තිබුණි. | සැලැස්මක් සකස් කළ යුතු වීම. | ඉවත්කිරීමේ ක්‍රියාවලියට යැවිය නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබේ. එම නිසා, ඉහළ බලධාරියාගේ අනුමැතිය සහිත ලිපිය මඟින් පත්වීම් ලබා දී තිබුණි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තියේ සඳහන් ආකාරයට ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ප්‍රතිශතයක විකුණුම් බදු අයකළ යුතුය. එසේ වුවත්, 2017 සහ 2018 ජුනි මාසය අවසානය දක්වා කාලපරිච්ඡේදයේ විකුණනු ලැබූ ඉඩම්වල මුළු එකතුව රු.550,994,583 ක් මත බදු ලෙස රු.5,509,945 ක් අයකිරීම සඳහා සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉඩම්වල විකුණුම් බදු අයකිරීම සඳහා ඔබගේ උපදෙස් අනුව කටයුතු කරනු ලැබේ. ප්‍රමාණවත් දැනුමක් නොමැති වීමෙන් මෙය ක්‍රියාත්මක කළ නොහැකිව තිබේ. |
| (ආ) | මාර්ගවල නිකරුණේ ගැවසෙන ගවයින් වැනි සතුන් නිසා මාර්ගයේ ගමන් කරන ජනතාව මහත් දුෂ්කරතාවලට මුහුණපාති. මේ නිසා එම සතුන් අල්ලා එම දුෂ්කරතා වලින් නිදහස් වීමටත්, මාර්ග අනතුරු වළක්වා ගැනීම සඳහාත් සමාලෝචිත වර්ෂයේ සභාවේ යෝජනා ඉදිරිපත් කර ඒ සඳහා කමිටු පත්කර තිබුණි. එසේ වුවත්, විගණන දිනය වන 2019 අප්‍රේල් 30 දින වන විටත් මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | සභාවේ තීරණය අනුව සභාවේ සභිකයින් වෙත අදාළ වගකීම් බෙදා දී තිබුණත් ඔවුන් විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පැවති සභා රැස්වීම්වලදී සභාවට අයත් කඩ කාමර සංකීර්ණ අලුත්වැඩියා කිරීමටත්, අලුතින් මස්කඩ ඉදිකිරීමටත් තීරණය කර තිබුණි. එසේ වුවත්, විගණන දිනය වන 2019 අප්‍රේල් 30 දින වන විටත් මේ | ඉඩම් හඳුනාගෙන කඩකාමර ඉදි කිරීම සඳහා පියවර ගත යුතු වීම. | මස්කඩ ඉදිකිරීම සඳහා තීරණය කර ඇති නමුත්, ඉඩම් හඳුනා නොගැනීම හේතුවෙන් එය සාක්ෂාත් කරගැනීමට නොහැකි විය. අඛණ්ඩව ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් ආරම්භක පියවරයන්වත් මේ දක්වා ගෙන නොතිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පැවති සභා රැස්වීම්වල සභාවේ සභිකයින් විසින් ප්‍රාදේශීය සභාවේ සංවර්ධන සහ මහජනතාවගේ සුභසිද්ධිය සැලකිල්ලට ගෙන විවිධ යෝජනාවන් ඉදිරිපත් කර තීරණ ගන්නා ලදී. නමුත් එම තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රමාණවත් ඉදිරි සැලසුම් සහ අධීක්ෂණයක් නොමැති වීමෙන් මෙම තීරණ ලේඛනවලට පමණක් සීමා වී තිබූ බවක් නිරීක්ෂණය විය. | තීරණයන්ට අනුකූලව ක්‍රියාත්මක කළ යුතු වීම. | සභාවේ සභිකයින් තුළ පවතින නොඑකඟතාවයන් හේතුවෙන් යෝජිත වැඩසටහන් නියමිත කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමේ ගැටළු තිබේ. |

### 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාවට අයත් ඉඩම් සහ ගොඩනැගිලිවල මුළු එකතුව රු.48,780,712 ක් ගිණුම්වල ඉදිරිපත් කර තිබුණි. නමුත් චංචල හා නිශ්චල දේපල ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීමට කටයුතු කළ යුතු වීම. | ස්ථාවර වත්කම්වල සත්‍ය වටිනාකම හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීම සඳහා පියවර ගෙන ඇත. |

### 3.5.2 නඩත්තුව සහ අලුත්වැඩියාවන් සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ විවිධ වත්කම් සහ තොග අයිතමයන් භාවිතයට සුදුසු හා භාවිතයට නුසුදුසු යනුවෙන් විවිධ වූ භාණ්ඩ පවතියි. එසේ වුවත්, ඒවා සලකුණු කර අලුත්වැඩියා කිරීමට | අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | භාණ්ඩ සමීක්ෂණයේදී මේ සඳහා ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙම වර්ෂයේ අදහස් කර ඇත. |

| | | |
|---|---|---|
| හෝ විනාශ කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර මෙලෙස අලුත්වැඩියා කර භාවිතා කළ හැකි භාණ්ඩ නියමිත ආකාරයට අසුරා ආරක්ෂිතව තැබීමට කටයුතු කර නොතිබුණි. | | |

### 3.5.3 වාර්ෂික භාණ්ඩ /තොග සමීක්ෂණය

----------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය ප්‍රාදේශීය සභාව විසින් පත්කළ නිලධාරීන් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් මගින් සමීක්ෂණය සිදුකරන ලදී. මෙම සමීක්ෂණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණය 2018 දෙසැම්බර් 31 දින පදනම් කරගනිමින් සිදු කළ යුතුය. තවද, මෙම දිනට පසුව සිදු වූ ලැබීම් හා නිකුත් කිරීම් සම්බන්ධයෙන් ගැලපීම් සිදුකර අවසන් තොගය ගණනය කළ යුතු වුවද, මෙම කාර්යයන් සම්බන්ධයෙන් ගණනය කිරීම් සැලකිල්ලට නොගෙන තොග සමීක්ෂණය සිදුකර තිබුණි. | පනතේ විධිවිධාන සහ චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතු වීම. | ඉදිරි කාලවලදී මෙම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 3.6 වාහන උපයෝජනය

--------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාවේ පවතින අංක EP PB /1184 දරන පිකප් වාහනය සඳහා රු.221,112 ක ඉන්ධන ලීටර් 2,327 ක් පුරවා භාවිතා කර තිබුණි. මෙම වාහනය භාවිතාය සම්බන්ධයෙන් වාහන ධාවන සටහන් පොත විගණන දිනය වන 2019 අප්‍රේල් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පනතේ විධිවිධාන සහ චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතු වීම. | අංක EP PB /1184 දරන පිකප් වාහනයේ ධාවන සටහන් පොත වැරදීමකින් වෙනත් ස්ථානයක තබා ඇති බව විසින් දන්වා තිබුණි. මේ සම්බන්ධයෙන් රියදුරුගෙන් පැහැදිලි කිරීම් විමසා ඇත. |

## 3.7 ප්‍රසම්පාදනය

### 3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රාදේශීය සභාවේ සම්පත් හා සේවාවන් ක්‍රියාත්මක කිරීම සඳහා පිළියෙල කළ යුතුය. එසේ වුවත්, සභාව විසින් භාණ්ඩ සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. සේවාවන් සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම, පිළියෙල කිරීම සඳහා මූලික ලියවිලි, යෝජනා, පළාත් පාලන ආයතනවල වර්ෂ 04 ක සංවර්ධන සැලසුම්වල ඇති යෝජනාවල සඳහන් සේවාවන් ආදිය සැලකිල්ලට නොගෙන පිළියෙල කර තිබූ සැලැස්මකි. | ප්‍රසම්පාදන සැලැස්ම සම්බන්ධ චක්‍රලේඛ සහ මාර්ගෝපදේශයන්ට අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | ප්‍රසම්පාදන සැලැස්ම මෙම වර්ෂයේ පිළියෙල කිරීම සඳහා පියවර ගනු ලැබේ. තවද, පළාත් පාලන සහකාරවරයාට මේ සම්බන්ධයෙන් උපදෙස් ලබා දී ඇත. |

### 3.7.2 භාණ්ඩ හා සේවාවන්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභාවේ අරමුදලින් රු.1,842,450 කට බොරළු කියුබ් 642 ක් මිලදී ගෙන තිබුණි. සභාවේ සභාපති, උප සභාපති සහ සභිකයන් සියළු දෙනා තමන් නියෝජනය කරනු ලබන ප්‍රදේශයේ ඇති මාර්ග නවීකරණය කිරීමේ අදහසින් බොරළු මිලදී ගෙන ලබා දී තිබුණි. මෙම බොරළු අදාළ මාර්ගවල දැමීමට පෙර සභාව විසින් තෝරාගැනීමේ පදනම, ඇස්තමේන්තුව, සභාවේ අනුමැතිය සහ බොරළු මිලදී ගැනීමේ ආකාරය ආදියත් සැලකිල්ලට ගෙන නොතිබුණි. මෙම බොරළු අදාළ | ලේඛන සහ සංග්‍රහයන් විගණනයට නියමිත කාලයේදී භාර දිය යුතුය. | බොරළු මිලදී ගැනීම සඳහා සභාවේ අනුමැතිය, තාක්ෂණික නිලධාරිගේ ඇස්තමේන්තු වාර්තාවත් ලැබී ඇති බව දන්වමි. තවද, තාක්ෂණික නිලධාරිගේ කර්මාන්තය අවසන් වාර්තාව ද ලැබී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | මාර්ගවලට නොදැමීම පිළිබඳ වාර්තාවන් රහිතව ගෙවීම් සිදුකර තිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වෙන්කරන ලද පළාත් සංවර්ධන ආධාර වැඩසටහන යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි තාලර්කුඩා වේඩර් කුඩිඉරිප්පු ප්‍රදේශයේ පානීය ජල නල සවිකිරීමේ අරමුණෙන් රු.1,000,000 ක ප්‍රතිපාදන සලසා මඩකලපුව ප්‍රාදේශීය ජාතික ජල සම්පාදන හා මලාපවහන මණ්ඩලයට රු.999,041 ක් ලබා දී තිබුණි. එසේ වුවත්, සභාව විසින් මෙම වැඩසටහන නිම නොවීම පිළිබඳ සාක්ෂි හා ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එසේම, මෙම වැඩසටහන සභාවේ වගකිව යුතු නිලධාරීන් විසින් අධීක්ෂණය කොට වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | පළාත් සංවර්ධන ආධාර වැඩසටහන යටතේ ලබා දී තිබූ ප්‍රතිපාදන පරිහරණය කිරීමේ වගකීම ප්‍රාදේශීය සභාව සතුය. මහජන අවශ්‍යතා සැලකිල්ලට ගෙන සභාව විසින් දියත් කළ වැඩසටහනක් නිසා ඒවා ක්‍රියාත්මක කිරීමේ වගකීම සභාව සතුවේ. | පළාත් සංවර්ධන ආධාර වැඩසටහන යටතේ තාලර්කුඩා වේලර් කුඩිඉරුප්පු ප්‍රදේශයේ පානීය ජල නල සවිකිරීමේ කාර්යයයේ සම්පූර්ණ වගකීම ජාතික ජල සම්පාදන හා මලාපවහන මණ්ඩලය සතු බව දැනුම් දෙමි. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 15(1) උප වගන්තිය අනුව, මූල්‍ය ප්‍රකාශන රජයේ සෑම මුදල් වර්ෂයක් අවසාන වූ පසු මාස 03 ක් ඉක්ම වීමට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුවේ. මේ අනුව, 2019 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. එසේ වුවත්, 2018 අංක 19 දරන විගණන පනතේ 16(2) උප වගන්තිය අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය අනුව කටයුතු කළ යුතු වීම. | මින් පසුව එළැඹෙන කාලවලදී මූල්‍ය ප්‍රකාශන නියමිත කාල වකවානුව තුළ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන කාර්යයන් සඳහා කමිටුවක් පත්කර 2018 ජනවාරි සිට ජුනි මාසය දක්වා කාලපරිච්ඡේදය සඳහා ගෙවීම් වවුචර් විගණනය කර කළමනාකරණය වෙත වාර්තා ඉදිරිපත් කර තිබුණි. එසේ වුවත්, එම වාර්තාව සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කඩිනම් ක්‍රියාමාර්ග ගෙන පොදු 172 ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. | අභ්‍යන්තර විගණන කමිටුව මඟින් ඉදිරිපත් කළ විගණන විමසුමට මූල්‍ය සහකරු විසින් ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ආ) | අභ්‍යන්තර විගණනය පිළිබඳව වාර්ෂික වැඩසටහන පිළියෙල කර තිබූ නමුත්, එම වැඩසටහනට අනුකූලව අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු වීම. | අභ්‍යන්තර විගණනය වැඩසටහනේ ඇති කාරණා මෙම වර්ෂයේදී නිරවුල් කරනු ලැබේ. |

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කළ යුතු වීම. | 2019 වර්ෂයේ සිට ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා තීරණය කර ඇත. |

**5. පද්ධති හා පාලන**

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | විගණන නිරීක්ෂණ | විශේෂ අවධානය යොමුකළ යුතු විෂයය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වේ. | චක්‍රලේඛ හා පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | හිඟ ආදායම් අයකර ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ. |
| (ආ) | අයවැය පාලනය | අයවැය පිළියෙල කිරීමේදී | චක්‍රලේඛ හා පනතේ | අයවැය පිළියෙල කිරීමේදී |

| | | | | |
|---|---|---|---|---|
| | | පසුගිය කාල තථ්‍ය වියදම් සැලකිල්ලට ගත යුතු වේ. | විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | පසුගිය කාල තථ්‍ය වියදම් සැලකිල්ලට ගනු ලැබේ. |
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගෙන යාම.<br>(ii) සභාවේ භාවිතා නොකර නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් භාවිතා කිරීම සඳහා පියවර ගත යුතු වේ. | චක්‍රලේඛ හා පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගෙන යාම සඳහා කටයුතු කෙරේ.<br>සභාවේ භාවිතා නොකරන වත්කම් භාවිතය සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. |